# උත්ථාන සමයේ පස්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 6:1 – 7

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

ඔව්හු ශුද්ධාත්මයාණන්ගෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වූ සත්දෙනෙකු තෝරාගත්හ.

ඒ දවස්වල දී ශ්‍රාවකයන්ගේ ගණන වැඩි වන කළ, හෙබ්‍රව් බස කතා කරන ජුදෙව්වන්ට විරුද්ධ ව ග්‍රීක බස කතා කරන ජුදෙව්වරු පැමිණිල්ලක් ඉදිරිපත් කළහ: දිනපතා සහනාධාර දීමේ දී, තමන්ගේ වැන්දඹුවන් නොසලකා හරිනු ලබති යි ඔව්හු කී හ. එවිට දොළොස් දෙනා ගෝල සමූහය රැස්කරවා, "අප දෙවි දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර කටයුතුවල යෙදී සිටීම කිසිසේත් සුදුසු නැත. එබැවින් සහෝදරයෙනි, මේ තනතුරට පත්කරන පිණිස, යහපත් යයි පිළිගත්, එසේ ම ශුද්ධාත්මයෙන් ද ප්‍රඥාවෙන් ද පූර්ණ සත්දෙනෙකු ඔබ අතරෙන් තෝරාගන්න. ඉන්පසු අපි යාච්ඤාවෙහි ද, ධර්ම දේශනාවෙහි ද නියුක්ත ව සිටිමු"යි කී හ. මේ යෝජනාව ගැන මුළු මහත් පිරිස සතුටු වූ හ. එවිට ඔව්හු ඇදහිල්ලෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ මිනිසෙකු වන ස්තේපන් ද ඔහු සමඟ පිලිප් ද ප්‍රොකොරස් ද නිකනෝර් ද තිමොන් ද පර්මේනස් ද ජුදෙව් ආගමට හැරුනු අන්තියෝකියේ නිකොලොස් ද තෝරා ගත්හ. ඔව්හු මේ අය ප්‍රේරිතයන් වෙත ඉදිරිපත් කළහ. ප්‍රේරිතයන් යාච්ඤා කොට ඔවුන් මත අත් තැබූ හ. තවද දෙවියන් වහන්සේගේ වචනය පැතිරී ගියේ ය. ජෙරුසලමේ ශ්‍රාවකයන්ගේ ගණන බොහෝ සේ වැඩි විය. පූජකයන්ගෙන් මහත් සමූහයක් ද ඇදහිල්ල පිළිගත්හ.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 33:1–2, 4–5, 18–19

**පිළිතුර:** සමිඳුනි ඔබවහන්සේගේ කරුණාව අප කෙරෙහි වේවා.

**ගීය :** දමිටුනි, හිමි තුමන් කෙරේ ප්‍රීති සන්තෝෂ වන්න.
ප්‍රශංසාව අවංක අයට හොබනා දෙයකි.
වීණාව වයා හිමි තුමන් පසසන්න:
තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම් ගීත ගයන්න.

සමිඳුන්ගේ වචනය අවංක ය:
එතුමන්ගේ ක්‍රියා සියල්ලක් ම විශ්වාසශීලී ය.
දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය.
මහ පොළොව හිමිතුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

සමිඳුන්ගේ නෙත් දේව ගරුබිය ඇත්තන් කෙරෙහි ය.
මරණයෙන් ගළවන පිණිස ද
දුබික් දුරුකොට දිවි රක්නා පිණිස ද
එතුමාණෝ දිවැසින් බලන සේක.

## දෙවන දේව ප්‍රකාශනය 1 පේදුරු 2:4–9

*ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

ඔබ වනාහි තෝරාගන්නා ලද ජනතාවකි.
රාජකීය පූජක පිරිසකි.

මිනිසුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවත් දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ, අනර්ඝ ජීවමාන ගලක් වැනි, උන් වහන්සේ වෙත පැමිණෙන්න. ආත්මික ගෘහයක් ගොඩනගන ලෙස ඔබ ජීවමාන ගල් මෙන් උන් වහන්සේ වෙත පැමිණ, එහි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින්, දෙවියන් වහන්සේට ප්‍රසන්න ආත්මික පූජා පුද කරන පිණිස ශුද්ධ පූජක පිරිසක් වන්න. එබැවින්: "බලන්න, තෝරාගත් ඉතා අනගි, කොණේ ප්‍රධාන ගලක් සියොන්හි තබමි: උන් වහන්සේ අදහන්නා

ලජ්ජාව ට නොපැමිණෙන්නේ ය''යි ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත. එබැවින් ඒ ගලෙහි වටිනාකමක් ඇත්තේ අදහන ඔබ උදෙසා ය. එහෙත් අදහා නොගත් අයට "ගෙවල් සාදන්නන් ප්‍රතික්ෂේප කළ ගල ම කොණේ ප්‍රධාන ගල වී ඇත." තවද: "එය පැකිළී වැටෙන පිණිස ගලක් ද බාධා වන පිණිස පර්වතයක් ද වී ඇත."

මන්ද, ඔව්හු වචනයට අකීකරු වෙමින් පැකිළෙති. එය ඔවුන්ට නියමිත දේ විය. එහෙයින්, අන්ධකාරයෙන් ස්වකීය විස්මපත් ආලෝකයට ඔබ කැඳවාගත් තැනැන්වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දන්වනු පිණිස ඔබ වනාහි තෝරාගත් වංශයක් ද රාජකීය පූජක පෙළක් ද ශුද්ධ ජාතියක් ද දෙවියන් වහන්සේ සතු සෙනඟක් ද වන්නහු ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ජොහන් 14: 6

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි:
මා මඟින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත
නොපැමිණෙන්නෝ ය''යි
ජේසුස් ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 14:1-12

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.

"ඔබේ සිත් නොකැළඹේ වා! දෙවියන් වහන්සේ අදහාගන්න මා ද අදහාගන්න. මාගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි වාසය කිරීමට ඉඩපහසු තැන් බොහෝ ඇත. එසේ නොවේ නම් ඒ බව මම ඔබට නොකියම් ද? ඔබට ස්ථානයක් සූදානම් කරන පිණිස යමි. මා ගොස් ඔබට ස්ථානයක් සූදානම් කළ විට, මා සිටින තැන

ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි. මා යන ස්ථානයට මාර්ගය ඔබ දන්නහු ය”යි වදාළ සේක. තෝමස් කතා කොට, “ස්වාමිනි, ඔබ කොතැනට වඩින සේක් දැයි අපි නොදනිමු: එසේ නම් මාර්ගය දැනගන්නේ කෙසේ දැ”යි ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි: මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය.

ඔබ මා හඳුනන්නහු නම් මාගේ පියාණන් වහන්සේත් හඳුනන්නහු ය. මෙතැන් පටන් ඔබ උන් වහන්සේ හඳුනන්නහු ය: උන් වහන්සේ දැක ඇතැ”යි වදාළ සේක. පිලිප් කතා කොට, “ස්වාමිනි, පියාණන් වහන්සේ අපට පෙන්වා වදාළ මැනව: එය අපට හොඳට ම ඇතැ”යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “පිලිප්, මෙපමණ කලක් මා ඔබ සමග විසූ නමුදු, තවමත් ඔබ මා හඳුනන්නේ නැද් ද? මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේ ය. එසේ නම්, ‘පියාණන් වහන්සේ අපට පෙන්වා වදාළ මැනැවැ’ යි ඔබ කියන්නේ කෙසේද? මා පියාණන් වහන්සේ තුළ ද, පියාණන් වහන්සේ මා තුළ ද සිටින බව ඔබ විශ්වාස නොකරන්නෙහි ද? මා ඔබ හට වදාරන වචන මාගේ ම අධිකාරී බලයෙන් නොවදාරමි: පියාණන් වහන්සේ ම මා තුළ වැඩසිටිමින් ස්වකීය ක්‍රියා ඉටුකරන සේක.

මා පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා තුළ ද සිටින බවට මාගේ වචනය විශ්වාස කරන්න: එසේ නැත්නම් මාගේ ක්‍රියා නිසාවත් මා විශ්වාස කරන්න. ඒකාන්තයෙන් ම මම එසේ, ඔබට කියමි, මා අදහාගන්නා මා කරන ක්‍රියා ද කරන්නේ ය. තවද මා පියාණන් වහන්සේ වෙතට වඩිනා බැවින් ඔහු මීටත් වඩා මහත් ක්‍රියා කරන්නේ ය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



## “මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.”

*උත්ථාන සමයේ පස්වන ඉරුදින - 14-05-2017*

### හැඳින්වීම

ප්‍රශ්නයක පැටළුණු විට ඔබ සොයන්නේ කුමක්ද? බොහෝ විට ඉක්මන් විසඳුමකි. එක් ප්‍රශ්නයකට විසඳුම් ගණනාවක් තිබිය හැකි නමුත් අප කැමති අපට පහසු, වාසිදායක විසඳුමක් වෙත යැමටය. අවාසනාවකට මේ විසඳුම් නිවැරදි විසඳුම් වන්නේ නැත. ප්‍රශ්නයක් තුළ අප සෙවිය යුත්තේ ඊට මුහුණ දිය යුතු නිවැරදි මාර්ගය යි. ඊළඟට ඒ ප්‍රශ්නයේ සත්‍යය පසුබිමයි. සත්‍යය අවබෝධ කරගැනීම ප්‍රශ්නය නිවැරදිව දැකීමට ඉවහල් වන අතර ඊට මුහුණ දීමට අපට අවශ්‍ය ජීවනය ලබා දෙයි. කෙසේ වුවත් මෙය මතු පිටින් පෙනෙන තරම් සංකීර්ණ නැත. මන්ද මාර්ගයත්, සත්‍යයත්, ජීවනයත් එකම තැනැත් වහන්සේ කෙනෙකි. ඒ ක්‍රිස්තුන් වහන්සේ යි. එමනිසා ප්‍රශ්නය තුළ ක්‍රිස්තුන් වහන්සේව සොයන්න. විසඳුම් නොසොයන්න.

### දේව වචනය

අප සිටින්නේ උත්ථාන සමයේ වුවත් අද අප සවන් දෙන්නේ ජේසුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු කල දේශනයෙන් කොටසකටයි. ඊට හේතුව අප ස්වර්ගාරෝහණය ආසන්නයේ සිටීමත් මෙම පාඨය තුළ ජේසුන් වහන්සේ තමන් වහන්සේ පියාණන් වහන්සේ වෙතට නැවත යැම ගැන කතා කිරීමත් වේ. එම කරුණු ගෝලයින්ට පැහැදිලි කර දීම සඳහා ක්‍රිස්තුන් වහන්සේට මහත් වෙහෙසක් දරන්නට වූ බව පෙනේ. කෙසේවුවත් ගෝලයින්ගේ අනවබෝධය සහ ඊට ක්‍රිස්තුන් වහන්සේ දෙන පිළිතුරු තුළින් අපට ඉතා වැදගත් සත්‍යතාවයන් කිහිපයක්

**ක්‍රියා 6:1-7**

**ගීතාවලිය 33:1-2, 4-5, 18-19**

**1 පේදුරු 2:4-9**

**ජුවාම් 14:1-12**

අනාවරණය වේ: පියාණන් වහන්සේ වෙතට යැමට මාර්ගය ක්‍රිස්තුන් වහන්සේ ය; පියාණන් වහන්සේ සහ ක්‍රිස්තුන් වහන්සේ ඒකත්වයක්ව හිඳින සේක; ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අදහන්නා බලවත් ක්‍රියා කරයි; ක්‍රිස්තුන් වහන්සේ මාර්ගය ද සත්‍යය ද ජීවනය ද වන සේක.

මුල් කිතුනු සභාව තුළ පැන නැගුණු ගැටළු සහගත අවස්ථාවක් ගැන අද පළමු කියවීමෙන් අපට අසන්නට ලැබේ. පලස්තීනයෙන් පිටත සිටි ජුදෙව්වරු ග්‍රීක භාෂාව කතා කළහ. පිටතට නොගොස් පලස්තීනයේ සිටි ජුදෙව්වරු හෙබ්‍රෙව් (ඇරමැයික්) භාෂාව කතා කළහ. පිටත සිටි සමහරු පසු කාලයේ දී නැවත පලස්තීනයට පැමිණියහ. භාෂාව නිසා මේ දෙපිරිස අතර ගැටුමක් පැවතිණි. ගැටළුවට විසඳුම ලෙස අපෝස්තුළුවරු කරන යෝජනාව අපෝස්තුළුවරුන්ගේ දැක්ම පිළිබඳව අපට අදහසක් ලබා දෙයි. අපෝස්තුළුවරුන් දේශනා කිරීම අතපසු කොට සමාජ සේවා වල යෙදීම නුසුදුසු බව ඔවුන්ගේ අදහස විය. පූජාප්‍රසාදිවරුන්ගේ කාලය මුළුමනින් ම පාගේ දේව වචනය ප්‍රචලිත කිරීම සඳහා වැය විය යුතු බව එයින් ගම්‍ය වේ.



මේ සතියේත් අපි පේදුරු තුමාගේ පළමු ලිපියේ කොටසකට දෙවන කියවීමෙන් සවන් දෙමු. ප්‍රසාද ස්නාපනය ලබා අලුතින් ක්‍රිස්තියානින් වූ ජනතාව ශුද්ධවන්තව ජීවත් විය යුතු බව පේදුරු තුමා අවධාරණය කරයි. කිතුනු ජනතාව ක්‍රිස්තුන් වහන්සේ කොනේ ප්‍රධාන ගල වී ගොඩනගන ගොඩනැගිල්ලේ ජීවමාන ගල් මෙන් වන බව පවසන එතුමා අප 1. තෝරාගත් වංශයක් ද 2. රාජකීය පූජක පෙළපතක් ද 3. ශුද්ධවූ ජාතියක් ද 4. දෙවියන් වහන්සේ සතු සෙනඟක් ද වන බව පෙන්වා දෙයි. දෙවියන් වහන්සේට සැබෑ යාගය පූජා කිරීමේ දී කිතුනුවන් සෑම කෙනෙක්ම ඊට සම්බන්ධ වන නිසා එක්තරා දුරකට අප ද පූජකවරුන් වේ. නමුත් මේ පොදු පූජකවරය, ආලේපනය ලද නිල පූජකවරයට වඩා වෙනස් බව සිහි තබා ගත යුතුය.

## මෙනෙහි කිරීම

අප ජේසුන් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන බව නිරන්තරයෙන් පැවසුවත් එසේ කිරීමට අපහසු වූ අවස්ථා කොතෙකුත් ඇත. දෙවියන් වහන්සේ අප අසල තබා මේ විශ්වයේ කොහේවත් නැතැයි සිතුණු කාලයන් අපට තිබේ. ඒ අප දුෂ්කර කාලයක හිරවී අන්තිම තැනටම හිරවුණු මොහොතයි. ඒ දක්වා අපි ඉතා ම හොඳින් විශ්වාසය රැක ගනිමින්, ආගමික වත් පිළිවෙත් වල යෙදෙමින් කාලය ගත කළෙමු. නමුත් එක මොහොතක දී අපට දෙවියන් වහන්සේව නොපෙනී ගියේය. විශ්වාසය බිඳ වැටුණි.



මේ වගේ වෙලාවට අපි සාමාන්‍යයෙන් මොකද කරන්නෙ? **දෙවියන් වහන්සේගෙන් විසඳුම් නැති නිසා අපි අපේ ක්‍රමයට විසඳුමක් හොයා ගන්න වෙහෙසෙමු. බොහෝ විට පවුලේ හෝ යහළුවන්ගේ පිහිට පතමු. ඔවුන්ගෙන් උපදෙස් ලබා ගනිමු. දෙවියන් වහන්සේගේ කැමැත්ත, අකමැත්ත අමතක කර අපට හොඳ යැයි සිතෙන විසඳුමකට යොමු වෙමු. මෙහි ප්‍රතිඵලය පාපයයි.** සොරකම් කර මුදල් ලබාගන්නේ ප්‍රශ්නයක් විසඳා ගැනීමට නොවේද? පඟාවක් දෙන්නේ ඒකට නෙමේද? දේවාලයකට, කෝවිලකට යන්නේ ඒ නිසා නෙමේද? අනියම් සම්බන්ධතාවල පැටලෙන්නේ මේ හේතුව නිසා නොවේද? සමහරු මිනී මරන්නෙත් තමන්ගේ ප්‍රශ්නයක් විසඳා ගැනීමට නෙමේද? නමුත් මේ කිසිම දෙයකින් ප්‍රශ්න විසඳෙනවාද? එහෙම විසඳුණු ප්‍රශ්නයක් ඇත්නම් කියන්න.

මෙතුවක් කල් ක්‍රිස්තුන් වහන්සේ සමග කමින් බොමින් තැන් තැන්වල ඇවිදිමින් රාජ්‍යයක් පිහිටුවීම ගැන බලාපොරොත්තු තබාගෙන ජීවත් වූ ගෝලයින්ටත් ක්‍රිස්තුන් වහන්සේව නොපෙනී යාමේ අත්දැකීමට මුහුණ දීමට කාලය එළඹී ඇත. තව සුළු මොහොතකින් ක්‍රිස්තුන් වහන්සේව ශාරීරිකව ඔවුන්ගෙන් වෙන් කෙරෙණු ඇත. එවිට ඔවුනුත් අද දවසේ දී අප මුහුණ දෙන තත්වයට ම මුහුණ දෙනු ඇත. සමහරු ප්‍රචණ්ඩත්වයෙන් විසඳුම් සොයන්නට උත්සහ කරනු ඇත. පේදුරු තුමා කඩුව ඇද්දේ ඒ නිසාය. තවත් අයෙක් ඉච්ඡා භංගත්වයට පත්වනු ඇත. පලා දුවනු ඇත. බියෙන් සැඟවෙනු ඇත.

එමනිසා ක්‍රිස්තුන් වහන්සේ ඔවුන්ට උපදෙසක් දෙන සේක: "ඔබේ සිත් නොකැළඹේවා." බැලූ බැල්මට මෙය විසඳුමක් නොවේ. ප්‍රශ්නයක හිර වෙලා ඉන්න වෙලාවට 'හිත කලබල කරගන්න එපා' කියලා කියන්න කාට බැරිද? ක්‍රිස්තුන් වහන්සේ ඊට තවත් යමක් එකතු කරන සේක: "දෙවියන් වහන්සේ අදහා ගන්න. මා ද අදහා ගන්න." මේකත් විසඳුමක් ලෙස එක්වර පිළිගත නොහැක. හිත වැටිලා සිටින මොහොතක නොපෙනෙන, නොඇසෙන දෙවි කෙනෙක් ගැන විශ්වාසයක් ඇති කර ගන්නේ කොහොමද?

විශ්වාසය තුළින් අපේ තුවාල වී ඇති හැඟීම් සුව වීමට නම් එම විශ්වාසය ගැඹුරින් අවබෝධ වී තිබිය යුතුය. විශ්වාසය සෑම විට ම අවබෝධය ලබා ගැනීමට උත්සහ කරයි. අවබෝධයෙන් තොර වූ විශ්වාසයට හැඟීම් සුව කිරීමේ හැකියාව ඉතා අඩුය. අපේ හැඟීම්, දැනුම සහ බුද්ධිය මත රඳා පවතියි. ප්‍රශ්නයක් ඇති විට අපේ බුද්ධියෙන් සහ දැනුමෙන් අපි එය විශ්ලේෂණය කර තේරුම් ගන්නට උත්සහ කරන අතර ඒ තේරුම් ගැනීමේ මට්ටම අනුව අපට ඇතිවන හැඟීම්වල ස්වභාවය තීරණය වේ. මේ සියල්ල සිදුවන්නේ අප එකිනෙකාට ජීවිතය පිළිබඳව තමන් සිත තුළ ඇති

රූපයට සාපේක්ෂවය. ක්‍රිස්තුන් වහන්සේ ගෝලයින්ට අලුත් රූපයක් දෙන සේක: *"මාගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ වාසස්ථාන ඇත. .... ඔබට ස්ථානයක් සූදානම් කරන පිණිස යමි."* අපේ විශ්වාසය ආරම්භ විය යුත්තේ මෙන්න මේ සත්‍ය රූපය මත පිහිටා සිටය.

මේ සත්‍යය අපට කියා දෙන්නේ කුමක්ද? "අපට තාත්තා කෙනෙක් සිටී. තාත්තාගේ ගෙදර අපට ඇති තරම් ඉඩ කඩ ඇත. ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් ඉඩ සූදානම් කරන සේක." මේ මහා සත්‍යය අප හිතනවාට වඩා බොහෝ විශාලය. මේ සත්‍යය නොදැන සිටින තාක් කල් අපි අපේ සිත් තුළ හදා ගත් කුඩා රාමු තුළ සිටිමින් දුක් විඳිමු. ආත්මික ලෝකයට ඇතුළු නොවී මේ සත්‍යය අවබෝධ කරගත නොහැක. නමුත් අවබෝධය ලබා ගැනීමට නම් පළමුව විශ්වාස කළ යුතුය. **කාවද විශ්වාස කළ යුත්තෙ? ක්‍රිස්තුන් වහන්සේව. උන්වහන්සේ ගැන මොනවද විශ්වාස කල යුත්තෙ? උන්වහන්සේ තාත්තා ළඟට අපව රැගෙන යන බව. ඒකෙන් කොහොමද අද දවසේ මගේ තියෙන ප්‍රශ්නය විසඳෙන්නෙ? මගෙ දුක නැතිවෙන්නෙ කොහොමද?**




ප්‍රශ්නය විසඳෙන්නෙ නෑ. හරියට ම කිව්වොත් ප්‍රශ්නය අපි හිතන විදිහට විසඳෙන්නෙ නෑ. දුකින් ඉන්න හැම කෙනෙකුගේ ම හිතේ තමන් ප්‍රාර්ථනා කරන විසඳුමක් තියෙනවා. "අනේ මේක මේ විදිහට වෙනව නම් ...." කියන අති මානුෂීය සිතුවිල්ල අප කාටත් තියෙනවා. බොහෝ වෙලාවට අපි දෙවියන් වහන්සේ ගැන විශ්වාස කරනවා කියලා කරන්නෙත් අපේ හිතේ තියෙන මේ විසඳුම දෙවියන් වහන්සේ ඉෂ්ට කරලා දෙයි කියන එකයි. ඒ නිසා ඒ වෙනුවෙන් නොකඩවා යාච්ඤාත් කරනවා. බාර හාර එහෙමත් වෙනවා. මේ අපේ ලොකුම වැරැද්දයි. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම යනු අපේ හිතේ තියෙන දෙයක් උන්වහන්සේ ලවා ඉෂ්ට කරගැනීමට උත්සහ කිරීම නොවේ.

එහෙම නම් මොකක්ද නිවැරදි විශ්වාසය? ක්‍රිස්තුන් වහන්සේ ගෝලයින්ට පෙන්වා දුන් සත්‍යය විශ්වාස කරන්න: "ඔබට අසීමිතව ආදරය කරන තාත්තා කෙනෙක් සිටියි. තාත්තාට ඔබ සඳහා සැලැස්මක් ඇත. ඒ සැලැස්ම තුළ ඔබ කිසිදා විනාශයට පත් නොවේ. එමනිසා ඔබ බිය යුතු නැත." ශාරීරික සහ මානසික තලයන් වල පමණක් සිරවී සිටින විට මේ විශ්වාසය දැරිය නොහැක. දේව වචනයට වඩා අපට විද්‍යාව විශ්වාසය. අපි ආත්මික අත්දැකීමට වඩා හැඟීම් වලට මුල් තැන දෙන්නෙමු. ජෙරමියාගේ පොතේ මෙසේ සඳහන් වේ: *“මිනිසුන් කෙරෙහි විශ්වාසය තබන, මියයන සුලු සිරුර ශක්තිය කරගෙන, සමිඳුන් කෙරෙන් හැරී ඉවත් ව යන මිනිසා සාප ලද්දෙකි”* (ජෙරමියා 17:5). එනම් මිනිසුන්ගේ ශක්තිය කෙරෙහි විශ්වාස කරන, ලෝකයේ බලය, ධනය, ගෞරවය මත යැපෙන අය විනාශ වේ. අනෙක් අතට ජෙරමියා මෙසේ ද පවසයි: *“සමිඳුන් කෙරෙහි විශ්වාසය තබන, සමිඳුන් තරයේ විශ්වාස කරන මිනිසා භාග්‍යවන්තයෙකි”* (ජෙරමියා 17:7).

කොහොම පැහැදිලි කර කර කිව්වත් ප්‍රශ්නයක හිරවී වැටුණු මොහොතක විශ්වාසයේ එල්ලී සිටීම පහසු නැත. ක්‍රිස්තුන් වහන්සේගේ වෙන්ව යෑම ගැන තැති ගෙන බියෙන් සිටි ගෝලයින් උන්වහන්සේට දෙන පිළිතුරු සහ අසන ප්‍රශ්න වලින් ඔවුන්ද බෙහෙවින් අවුල්ව සිටි බව පැහැදිලිය.

ප්‍රශ්නය ඇතුළේ සිටිමින්, වැරදි විසඳුමකට නොයා හිඳීම වේදනාකාරීය. ඒ වේදනාවට කළ හැක්කේ කුමක්ද? අපේ වේදනාව ශුද්ධවත්ව දරාගෙන ජීවත් වීමෙන් අපට ඒවා දෙවියන් වහන්සේට ඔප්පු කළ හැක. ඔබේ කාටවත් නොපෙනෙන දුක පූජාවක් කොට දෙවියන් වහන්සේට ඔප්පු කරන්න. ඒ සඳහා අප සියලු දෙනාට ම ප්‍රසාද ස්නාපනය තුළින් පූජකවරයකට වරම් ලැබී ඇති බව දෙවන කියවීමෙන් පේදුරු තුමා පවසයි. (පේදුරු තුමා මෙහි සඳහන් කරන පූජකවරය, කතෝලික පියතුමන්ලාගේ නිල පූජකවරය -ministerial priesthood - සමග පටලවා නොගත යුතුය. මෙහි අවධාරණය කරන්නේ අප සියලු දෙනාටම හිමි පොදු පූජකවරයයි. රෙපරමාදු භක්තිකයින් පටලවාගෙන සිටින්නේත් මෙතැනය.)

**එමනිසා ඔබට හිමි වී ඇති දෛනික කුරුසිය රැගෙන ගමන් කිරීමට සූදානම් වන්න. ඒ සඳහා බිය නොවන්න. මන්ද මේ කිසිම දෙයක අවසානය කුරුසිය නොවේ. කුරුසිය වේදනාකාරී වුවත් ගමන එතැනින් අවසාන නොවේ. කුරුසියට පසුව උත්ථානය අනිවාර්යයෙන් ම පැමිණේ. මේ ගෙවී යන උත්ථාන සමය තුළ ජේසුන් වහන්සේ අපට උගන්වන්නේ එයයි.**

කලින් ඇසූ ප්‍රශ්න අපි නැවත අසමු. කාවද අපි විශ්වාස කළ යුත්තෙ? ක්‍රිස්තුන් වහන්සේව. ඇයි? මන්ද උන්වහන්සේ සත්‍යයයි. උන්වහන්සේව දැන ගැනීම සත්‍යය අවබෝධ කරගැනීමයි.

ක්‍රිස්තුන් වහන්සේ මොනවා කරනවා කියලද අප විශ්වාස කළ යුත්තෙ? අපව පියාණන් වහන්සේ ළඟට ගෙනියන බව. ඇයි? ක්‍රිස්තුන් වහන්සේ තමයි මාර්ගය. ක්‍රිස්තුන් වහන්සේව දැන ගැනීම යනු පියාණන් වහන්සේ වෙතට යන මාර්ගය අවබෝධ කරගැනීමයි. වැඩි දෙනෙක් හිතන විදිහට මේක අපේ මරණයෙන් පසු යන ගමනක් නොවේ. අපට දැන්, මේ ලෝකය තුළ දී ම පියාණන් වහන්සේ සමග බද්ධ විය හැක. ක්‍රිස්තුන් වහන්සේ ජීවත්ව සිටි කාලයේ දී පියාණන් සමග ඒකත්වයක් ව සිටි සේක. ඒ ඒකත්වය තුළට අපට ද ඇතුළු වීමට අවස්ථාව ඇත.

මෙසේ විශ්වාස කිරීමෙන් මොනවද අපට ලැබෙන්නෙ? විශ්වාස කළ පමණින් අපට අවශ්‍ය කරන විදිහට ප්‍රශ්න නොවිසඳෙන බව කලින් සඳහන් කළෙමු. එහෙනම්? අපට ශුද්ධාත්මයාණන් ලැබේ. මන්ද ක්‍රිස්තුන් වහන්සේ ජීවනය ද වන සේක. උන්වහන්සේ කෙරෙහි අදහන අයට උන්වහන්සේ ශුද්ධාත්මයාණන් දෙන සේක. **බොහෝ දෙනෙක් සිතන්නේ ශුද්ධාත්මයාණන් ලැබීම යනු හාස්කම් කිරීමේ බලය ලැබීම බවයි. නැත. සරලව කිව්වොත් ශුද්ධාත්මයාණන්ගෙන් පිරීම යනු ප්‍රීතිමත්, සාමකාමී ඇතුළාන්තයක් ලැබීමයි. එවිට ඔබට ප්‍රශ්නය අවසන් වීමට ම අවශ්‍ය නැත. ඔබ සොයන විසඳුම ලැබීමට ද උවමනා නොවේ. නමුත් ප්‍රීතියක් සහ සාමයක් ඇ**ත. එය ශුද්ධාත්මයාණන් ගෙන් මිස කිසිම දවසක, කිසිම මිනිසෙකුගෙන් ලැබිය නොහැක. එමනිසා එකම මාර්ගය ද, එකම සත්‍යය ද එකම ජීවනය ද වන ක්‍රිස්තුන් වහන්සේ වෙත ඇදෙමු.

***“සමිඳුනි, ඔබවහන්සේගේ සත්‍යය මට අවබෝධ කර දී, ඔබවහන්සේගේ ජීවනයෙන් මා පුරවා, ඔබවහන්සේගේ මාර්ගයේ මා ගමන් කෙරෙව්ව මැනව. මගේ විශ්වාසය වැඩි කර වදාළ මැනව.”***

*irudinasupuwatha@gmail.com*